යම් කිසි සමාජ ගැටළුවක් අන්තර්ගත වන පුවතක් භාවාතිශය ලෙසින්, පහත් රසයක් ලබාදෙන අයුරින් ඉදිරිපත් කිරීම අපට ඇතැම් විටක ජනමාධ්‍යකරණයේදී දක්නට ලැබේ. "දස දෙනෙකුට පෙම්වතිය විකුණූ අමුතු වෙස්සන්තර" යන සිරස්තලයෙන් යුතුව දිවයින පුවත්පතේ පළවී ඇති ලිපිය ඊට උදාහරණයකි.

කෙසේ නමුත් මේ ඔස්සේ සමබර හා අපක්ෂපාතී ලෙස තොරතුරු ඉදිරිපත් කිරීමකට ඉඩ ලැබෙනු ඇතැයි ඔබ සිතන්නේද? මෙවන් උද්වේගය හා පහත් රසයක් දනවන ලිවීමක් ඔස්සේ, එම ලිපියට පාදක වූ සිදුවීමේ ඇති සැබෑ තොරතුරු පාඨකයාට ග්‍රහණය කරගැනීමට හැකි වනු ඇතිද? ඒ වෙනුවට හුදෙක් අවර ගණයේ කථාන්තරයක් පමණක් ඉතිරි නොවන්නේද?

එපමණක් නොව එසේ ජනිත වන අවර ගණයේ පහත් රසය සමගින් අදාළ වින්දිතයාවද නැවත වතාවක් ලිපිය තුළ අපහරණයට ලක් නොවන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #SundayDivaina